Page 8 Aug-Sep 2012 .qxd 24/09/2012 14:30 Page 1



## කවි කොළය

# බණ ශාලාවට දෙව්ලොවින් දෙවියෙකු ආ දා!



ගරු හිමිනමක් කලු
සිවුරක් දැරුව උරෙන්
බණ දේසනාවක
නියැලෙයි මියුරු සරෙන්
පින්බර ජනී ජනයෝ
යුතු සැදැහැ බරෙන්
පතුරති සාදු නාදය
හැකි තරම වැරෙන්

ඒ හඬ සදෙව් ලොව දෙවියන් හටද ඇසී
එක් දේවතාවෙක් සැකයක් මතුව කිසී
දක්නට සැබෑ තතු විමසා කරුණු නිසී
අහසින් පැමිණ මේ බණ අසපුවට බසී

පළඳා අඳුර දිදුලන දිව බරණ රැසින්
දෙවියෝ සිටිත් අට ඉස්බක් බිමට උසින්
බැතිමත් පිරිස මේ පෙළහර දුටුව ඇසින්
නැගුවහ. සාදු හඬ කන්අඩි පැලෙන ලෙසින්

දෙවියා කියයි, "ඔබ හැම මොහොතකට පෙර
දුටුවෙමි නිවන් පැතුවා. බණ අසන වර
දිය හැක ඔබට සසරෙහි දුක ඉවර කර
මා ළඟ යතුර ඇත නිවනෙහි අරින දොර"

"බව ගිම් නිවා සැනසීමට සියලු සත
මේ පොහොදිනේ බලයක් මා සතුව ඇත
එකියන නිවන් සුව විඳුමට අපරී මිත
රිසි අය වෙතොත් දැන් ඔසවනු මැනවි අත"

ගොළු වී සිටිති බණ මඩුවේ සියළු දෙන
දෙවියා එයින් පසු අහසින් බිමට පැන
එහි සිටි පිරිස කැඳවා වෙන වෙනම ගෙන
ඇසුවා කරුණ නිවනට අකමැතිද යන

"කැමතියි, එහෙත්, හෙට පඩි දවසය මාගේ"
දුක පළ කළා මුලටම සිටි මිනිසා ගේ
"ඇයි ඔබ අදම ආවේ? කරුමෙට මාගේ
නැතිනම් දෙන්න තිබුණා මගෙ සහ යෝගේ"

"අද මා නිවන් දැක්කොත් සසරෙහි නැලී
කුණුවෙයි මාලු ටික පෙට්ටිය තුළ ලැලී"
පැහැදිලි කළා තතු ධීවර මුදලාලී
කීවා නිදහසට තව තව දිග හැලී

දායක සභාපති, ලේකම්, ඇදුරු තුමා
ටියුෂන් ගුරා අපචාරෙහි යෙදුණු ළමා
දෙවියන් හමුවෙ බිලිකොකු මෙන් සිරුර නමා
නොයෙකුත් කරුණු කීවෝ නිදහසට තමා

පැවසූ කරුණු අසමින් මේ සියළු දෙන
පුදුමෙට පත්ව සිටි දෙවියා බැරිම තැන
"ඔබවත් නිවන් දක්නට එන්නෙහිද?" යන
ඇසුවා පැනය හිමියන්ගෙන් දෙසුව බණ

"හෙට තියෙනවා ජනපති
මැදුරෙහි දානේ
මොනවා වුනත් ඒකට
නොගිහින් බෑනේ
තව බුදු කෙනෙක් එයි
කල්පය අව සානේ
බැරුවයි යන්න වෙන
දවසක නෙරුවානේ!"



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## අවමංගල්‍ය Obituary

### Mr Evans Cooray එවන්ස් කුරේ මහතා



**ලේ**ඛකයෙකු, පත්‍රකලාවේදියෙකු, ගුවන්විදුලි නිවේදකයෙකු සහ ප්‍රවීන ජනමාධ්‍ය ශිල්පියෙකුද වූ එවන්ස් ගුණලාල් කුරේ මහතා පසුගිය මස ලන්ඩනයේ දී අභාවප්‍රාප්ත විය. ඔහුගේ අවමංගල්‍යය පවුලේ අය හා හිතවතුන් බොහෝ පිරිසකගේ සහභාගිත්වයෙන් අගෝස්තු මස **24** වන සිකුරාදා උදයේ ලන්ඩනයේ වට්ෆර්ඩ් පෙදෙසේ කාපෙන් ඩර්ස් පාක් සුසාන භූමියේ දී සිදුකරන ලදී.

පත්‍ර කලාවේදියෙකු ලෙස බොහෝ දෙන එවන්ස් දැන සිටිය නමුත් වඩාත් ප්‍රකටව කාටත් ඔහු පෙනුණේ නැසීගිය ශ්‍රීලංකා ජනාධිපති ආර් ප්‍රේමදාස මහතාගේ ප්‍රවෘත්ති ලේකම් වශයෙන්ය. වසර ගණනාවක් ඔහු ප්‍රේමදාස මහතා සමග අතිශය සමීපව කටයුතු කළ අතර ජනාධිපතිවරයා මරුමුවට පත් වූ ඒ මොහොත දක්වාම ඔහුගේ ළඟින්ම සිටියේ ය.

හැටේ දශකයේ ශ්‍රීලංකා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට බැඳුණු එවන්ස්ට බොහෝ මැති ඇමතිවරුන් හඳුනාගන්ට ඉඩ ලැබුණි. එසේම ඔහුගේ දක්ෂතාව, කාර්යශූරබව සහ දැනුම බොහෝ දේශපාලකයින්ගේ සිත් ගත් කරුණු විය. ප්‍රේමදාස ජනාධිපතිවරයා හා ඇසුරට හේතු වූයේ ද එයයි.

ශ්‍රීලංකාවේ මාධ්‍යයට සම්බන්ධ, එසේම අත්දැකීම් ඇති, බොහෝ දෙනා පවසන පරිදි ප්‍රේමදාස මහතා ඇසුරේ කටයුතු කිරීම එතරම් ලේසිපාසු වැඩක් නොවේ. ඒ හිදීම කළ හැකිනම් එයම ජයග්‍රහණයක් බව ඔව්හු කියති. ඒ සියළු සමත්කම් එවන්ස් තුළ තිබුණා සේම ඒ ඇසුරින් ඔහු ලත් ලංකාවේ ඒ යුගයේ දේශපාලන අත්දැකීම් තවත් කෙනෙක් ලබා ඇත්දැයි සැක සහිත ය.

වසර කීපයකට පෙර ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්‍යාලයේ ප්‍රවෘත්ති උපදේශක හැටියටද සේවය කරමින් ඔහු දිවංගත ප්‍රේමදාස ජනාධිපතිවරයා ඇසුරේ තමා ගත කළ කාලයද තම අත්දැකීම් තුළින් ප්‍රේමදාස මහතා දකින ආකාරයද අළලා **ජනසෙත සැදූ ජනපති සෙවනේ** යනුවෙන් ග්‍රන්ථයක් ද සම්පාදනය කළේ ය.

ප්‍රේමදාස මහතාගේ ප්‍රවෘත්ති ලේකම් වශයෙන් සිටිනා සමයේ වුවද ඔහු කිසිදු පක්ෂ භේදයකින් තොරව මිනිසුන් ඇසුරු කළ අතර, හැකි හැමවිටකම කාට හෝ පිහිට වන්නට මැලිවූයේ නැත. එසේම ඔහු තම හිතවතුන් අමතක කළේ නැත. ඔහුගේ අභාවය පිළිබඳව බොහෝ දෙනා දුක්වන්නේ එබැවිනි.

එවන්ස් හොඳ සැමියෙකු පියෙකු සේම සීයා කෙනෙකු ලෙස පවුලේ ආදරයට පාත්‍රව සිටි බව බොහෝ දෙන දනිති. ඔහු මෙම ලංකාවිත්ති පත්‍රයේද හිතවත් පාඨකයෙකි. ඇසුරට ඉතා යහපත් මිනිසෙකි.

එවන්ස් ගුණලාල් කුරේ මහතාට නිවන් සුව පතමු!

♦ ලංකාවිත්ති

**The High Commission of Sri Lanka**
**cordially invites you to a**
**Photographic Exhibition** on
**"Recent progress on reconciliation & development in Sri Lanka"**
at the Sri Lanka High Commission
13, Hyde Park Gardens
London, W2 2LU
**on 20th September 2012 from 9.30am-9.30pm**.
( Nearest Tube Station: Paddington/ Lancaster Gate)



**ඉරිදා** - අර ගැලිලියෝගෙ කාල වගේම ලංකාවෙ සමහරු
**SUN** තවම දන්නෙ නැහැ පොළව ගෝලාකාරය කියලා. හිතාගෙන ඉන්නෙ පොළව රොටියක් වගේ පැතළිය කියලා. ඒ ගණයට අපේ ලොකු නංගිලත් වැටෙනවා. ලංකාවෙ වෙලාව උදේ නමය නම් එහේ අය හිතන්නෙ ඒ වෙලාවෙ මුළු ලෝකෙ හැම රටකම වෙලාව උදේ නමයයි කියලා. මෙහේ පාන්දර තුනට ටෙලිපෝන් එක වදිනවා. බලනකොට නංගි. ඉතින් අක්කෙ කොහොමද? කියලා අහනවා. මං කිව්වා යකෝ මේ එළිවෙන ජාමෙ උඹලට මොළයක් නැද්ද ? කියලා. ඒ පාර කියනවා, ඒ වුනාට මෙහේ උදේ නමය පහුවුණා විතරයි නේ අක්කෙ කියලා. මම ටෙලිපෝන් එක මුලින්ම ඇදලා දැම්මා. එළිවෙන කල් නින්ද ගියේ නෑ. හරි කේන්තියි!

**සඳුදා** - නිහාල් වෙබ් එක කාල් ගාලා කොහොම හරි
**MON** පැරලිම්පික් වලට ටිකට් හතරක් අරගෙන තිබුණා. ක්‍රීඩා ඉවරවෙන්න දවස් දෙකකට ඉස්සෙල්ලා අපි ගියා ඔලිම්පික් බලන්න. හරි සෙනග. යනකොට අපේ ආසන හතර ඉතුරුවෙද්දි අනෙක් සේරම පිරිලා. ක්‍රීඩා තරඟ දොළහක් දැක්කා. පදක්කම් දෙනවත් දැක්ක. මේජර් කරුණාරත්න ඇවිත් හිටියා ඔක්ස්ෆර්ඩ් ඉඳල එයාගෙ පවුලෙ කට්ටියත් එක්ක. ලංකාවෙ වෙන කිසි කෙනෙක් හම්බවුනේ නෑ. ලංකාවෙන් ආපු දොඹගොඩ කියන ක්‍රීඩකයා උස පනින තරඟය දැක්කා. ඒක පුදුම වැඩක්. ඒ අයට තිබුණෙ එක කකුලක් විතරයි. තනි කකුලකින් ඇවිදින්නත් අමාරු එකේ අඩි ගණනක් උස පනින්නෙ කොහොමද? ඒත් මේ හාදයො පැන්න නේ. අන්න ඒවා තමයි මේ ලෝකෙ පුදුම දේවල් කියන්නෙ.

**කුජදා** - ෂහ්! අපේ රණවිරුවෙක් අද පැරලිම්පික්වල මීටර්
**TUE** 400 තරඟෙන් ලෝකඩ පදක්කමක් දිනුවා ටෙලිවිෂන් එකේ දැක්කා. අනේ ඊයෙ අපි ගිය දවසෙ ඒක වුණා නම් අපි ස්ටේඩියම් එක දෙක වෙන්න කෑගහනවා. අපේ දුව ලංකාවෙ කොඩියකුත් ඊයෙ අරන් ගිහින් තිබුණා. කමක් නැහැ අපි හිටියත් නොහිටියත් ලංකාවෙ ක්‍රීඩා ශූරයා අසූදාහක් සෙනග ඉදිරියේ ඒ පෙන්නූ දහිරිය දස්කම සුපර් තමයි. ඒ ජයග්‍රහණය දැක්කද කියලා අහන්න අද ටෙලිපෝන් කරපු හැමෝම කිව්වෙ අතපය හොඳට තියන කස්ටිය ඇවිල්ලා නිකම්ම ඔහේ යන්න ගියා. ආබාධත් එක්ක දුවලා ලබපු මේ ජයග්‍රහණයෙ වටිනාකම මනින්න බැහැ කියලයි. ඒක හැබෑව. මේ පදක්කම රන් පදක්කමක් හා සමානව අපිට වටිනවා. මේ අපේ රටට හිමිවුණු තුන්වෙනි ඔලිම්පික් පදක්කම. ඉස්සරහට තව ඒවි. ඒකෙ දෙකක් නෑ.

**බුදදා** - දැන් ලංකාවෙ හැම දෙයක්ම කරන්නෙ සාස්තර
**WED** කාරයො කියන විදියට. ආතර් මාමගෙ මස්සිනා කෙනෙක් ඔපරේෂන් එකකට කොළඹ ලොකු ගෙවන වාට්ටුවකට ඇතුල්කරලා. දවස් හතරකට රුපියල් ලක්ෂ ගණනක් බිල. ඔපරේෂන්එක ඉවරවෙලා ටිකට් කැපුවම ලෙඩාගෙ නැන්දම්මා ඒකට විරුද්ධ වෙලා තියනවා. සාස්තරේට කිව්වයි කියලා ලබන මාසෙ වෙනකල් ගෙදර ගෙනියන්න එපැයි, තද බල අපලෙයි, ඉන්න භූමියෙන් හොල්ලන්න එපාය, මාරකයක් තියනවයි කියලා. වාට්ටුවෙන් කිව්වලු ප්‍රශ්නයක් නෑ, ඉන්න ඕනම නම් කැමති කාලයක් ඉන්න පුළුවන්. රූම් එකට දවසට අටදාහක් ගණනෙ ගෙවන්න කියලා. මෙන්න බොලේ ඒක කියපු ගමන් එවලෙම ලෙඩා ගෙදර ගෙනැත්.

**ගුරුදා** - ලංකාවට වෙච්ච ලොකුම අවාසනාව තමයි තඹ
**THU** සතයක් නොවටින මීහරක් දේශපාලනේට බැහැලා මැති ඇමතිවරු වෙන එක. ඒ මදිවට උන්ගෙ මදාවි පුත්තු රට විනාසකරනවා. ඇමති මර්වින් සිල්වගෙ මදාවි, රස්තියාදුකාර පුතයි, තව හිටපු දේසපාලුවෙකුගෙ පුතෙකුයි එකතු වෙලා, උන්ට සිගරට් එක පත්තුකරන්න ගිනි පෙට්ටියක් දුන්නෙ නෑ කියලා, හමුදාවෙ බුද්ධි අංශයෙ මේජර් කෙනෙකුට හොඳටම ගහලා ඔලුව පලලා. ඒ මනුස්සයා ඉස්පිරිතාලෙ. පිස්තෝලෙත් උන් උදුරගෙන ගිහිල්ලා. නොදකිං මෙහෙම කාලකණ්ණි ජාතියක්. මුන් ඉන්න රටකට මේ සම්ම ජාතියෙ වගතුවක් වෙනවද? මේ අපේ රට ලංකාවද? දැන් ඒ මදාවියා අල්ලන්න පොලීසියත් බයයි. පොලීසිය කියනවලු ඇමතිතුමාගෙ පුතා නිසා අපට මුකුත් කරන්න බෑ කියලා.

**කිවිදා** - යුද්ධ තියන කාලෙට යුද හටයො කියන්නේ රණ
**FRI** විරුවො. ඒ අය යුද්ධ කරන්න ඕන, රට ආරක්ෂාකරන්න ඕන. යුද්ධට ගිහිං වෙඩිකන්න ඕන. ත්‍රස්තවාදීන්ගෙන් මැරුම්කන්න ඕන. යුද්දෙ ඉවරවෙලා ගෙදර ආවම අර රණවිරු නාම, ආමන්ත්‍රණ මුකුත් නෑ. කොහේදිවත් තඹ සතේකට ගණන් ගන්නෙ නෑ. ඒ මදිවට ආරක්ෂාව ලබපු මිනිස්සුම හටයන්ට අල්ලගෙන ගහනවා. ඔලුව පලනවා. පොලීසියට ගිහිං කිව්වට වැඩකුත් නෑ. ආණ්ඩුව තඹේකට ගණන් ගන්නෙත් නෑ. ඒ තමයි ලංකාවෙ දැන් හැටි. ආයිත් යුද්ධයක් ආවොත් එදාට රණවිරුවො ලංකාවෙන් නම් ඉතිං හොයන්න හම්බවෙන්නෙ නෑ. ඒ තැනට තමයි මුන් මේ රට දැන් ගේන්න හදන්නෙ.